## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

### ශ්‍රී ලංකා පුස්ථකාලයාධිපති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා පුස්ථකාලයාධිපති සේවාව පිළිබඳ ව්‍යවස්ථාව පහත දැක්වේ.

ඩික්සන් නිලවීර
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි
කර්මාන්ත අමාත්‍යාංශය

1997 නොවැම්බර් මස 13 වැනි දින
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දී ය.

01. ක්‍රියාත්මක වන දිනය - මෙම ව්‍යවස්ථා සංග්‍රහය 1997.08.01 වැනි දින සිට ක්‍රියාත්මක වනු ඇත.

02. නිර්වචන :

2.1 "ව්‍යවස්ථා සංග්‍රහය" යන පදවලින් අදහස් කරන්නේ ශ්‍රී ලංකා රජයේ පුස්ථකාලයාධිපති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.

2.2 "අධ්‍යක්ෂ ජනරාල්" යන පදවලින් අදහස් කරන්නේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ය.

2.3 "සේවය" යන පදයෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයයි.

2.4 "සතුටුදායක සේවා කාලය " - පසුගිය පස් අවුරුදු සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇති, ඒ කාලය තුළ ලද වරදකට (අවවාද කිරීමෙන් හැර) වෙනත් කිසිදු දඬුවමක් ලබා නැත්තා වූ නිලධරයකු පමණක් සතුටුදායක සේවා කාලයක් ඇත්තකු සේ සැලකේ.

03. ව්‍යුහය, වැටුප් පරිමාණය හා සේවක සංඛ්‍යාව :

3.1 සේවක සංඛ්‍යාව කාලානුරූපව වෙනස් විය හැකිය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළාත් රාජ්‍ය සේවය හැරුණුවිට, මධ්‍ය රජය යටතේ පවතින පුස්තකාලයාධිපතිවරුන්ගේ සංඛ්‍යාව මෙයින් අදහස් කෙරේ.

3.2 මෙම සේවාව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලනයට යටත් වනු ඇත.

3.3 සේවාවන් තුළ පවතින පන්ති හා ශ්‍රේණි ද වැටුප් ක්‍රම ද පහත සඳහන් පරිදි වේ. III වැනි හා II වැනි ශ්‍රේණීන් ඒකාබද්ධ ශ්‍රේණීන් වේ.

| ශ්‍රේණිය | වැටුප් කාණ්ඩය වැටුප් පරිමාණය | |
|---|---|---|
| III වැනි ශ්‍රේණිය (ටී-11-1) | රු. 67,320-10x1,560-6x2,460-රු. 97,680 | (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/97 අනුව) |
| | කා.ක.ඉ. - 72,000ට පෙර | |
| II වැනි ශ්‍රේණිය (ටී-11-2) | රු. 68,340-6x1,560-9x2,460-රු. 99,840 | |
| | - කා.ක.ඉ. 73,020 | |
| I වැනි ශ්‍රේණිය (ටී-11-3) | රු. 70,200-4x1,560-10x2,460-1x2,700 -රු.103,740 | |
| අධි ශ්‍රේණිය (ටී-5-3) | රු. 97500-11x2,700-රු. 127,200 | |

වයස අවුරුදු 45 සම්පූර්ණ වීම අනුව කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු නොලැබේ.
මෙම වැටුප් පරිමාණයන් රජය මගින් වරින් වර කරනු ලබන සංශෝධනවලට යටත්ය.

අන්තර්ග්‍රහණය. - පුස්තකාල සේවයේ III වැනි ශ්‍රේණියේ 1997.08.01 වැනි දිනට වසර 10ක සතුටුදයක සේවා කාලයක් ඇති නිලධාරීන් II වැනි ශ්‍රේණියටද, II වැනි ශ්‍රේණියේ වසර 10ක සතුටුදයක සේවා කාලයක් ඇති නිලධාරීන් I වැනි ශ්‍රේණියටද අන්තර්ග්‍රහණය කරනු ලැබේ. දැනටමත් I වැනි ශ්‍රේණියේ සිටින නිලධාරීන් නව ව්‍යවස්ථාව යටතේ ඇති කරනු ලබන I වැනි ශ්‍රේණියට හා III වැනි ශ්‍රේණියේ හෝ II වැනි ශ්‍රේණියේ අවුරුදු 10ක සේවයක් සම්පූර්ණ කර නැති අයට පිළිවෙලින් නව ව්‍යවස්ථාව යටතේ ඇති කරනු ලබන III වැනි ශ්‍රේණියට හෝ II වැනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ඇත. මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වනවිට සේවයේ සිටි නිලධාරීන්ට පමණක් මෙය අදාළ වනු ඇත.

04. තනතුරු සංඛ්‍යාව - සියළු ශ්‍රේණීවල පැවතිය යුතු තනතුරු සංඛ්‍යාව, ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ජේදයේ I වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව, ඒ ඒ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව හා වර්තමාන අවශ්‍යතාවයන්ද, සැලකිල්ලට ගෙන අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග සාකච්ඡා කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

සේවක සංඛ්‍යාව පවතින අවශ්‍යතාව අනුව වරින් වර වෙනස් වීමට ඉඩ තිබේ.
III වැනි ශ්‍රේණියේ පවතින පුරප්පාඩුවලින් 75% විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත පුරවනු ලබන අතර, ඉතිරි 25% සීමිත තරග විභාගයක ප්‍රතිඵල මත පුරවනු ලැබේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය - III වැනි ශ්‍රේණිය
(අ) විවෘත තරග විභාගය - අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී හෝ ඊට සමාන විභාගයකදී-

1. (අ) සිංහල/දෙමළ භාෂාව හා
(ආ) අංක ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ ගණිතය යන විෂයන්ගෙන් එකක්ද, ඇතුළුව තවත් විෂයයන් 04කට සම්මාන සහිතව විෂයයන් 06කින් සමත්වීම අවශ්‍ය වේ. මෙයින් විෂයයන් 05ක් එක්වර සමත්වී තිබිය යුතුය: සහ
(ඇ) අ.පො.ස.(උ.පෙ.) විභාගයේ දී ඕනෑම විෂයයන් 03කින් සමත් වී තිබිය යුතුය : ඉහත 1 හි අ, ආ,ඇ සඳහන් අධ්‍යාපන සුදුසුකම් ඇතිව,
(ඈ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රථම පරීක්ෂණයෙන් : හෝ
(ඉ) ශ්‍රී ලංකාව තුළ පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යා සහතික පත්‍ර පරීක්ෂණයේ 1 කොටසින් හෝ සමත්ව වෘත්තීය සුදුසුකම් ලබා සිටින අය ද III වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර සඳහා වන විවෘත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

විභාග ක්‍රමය :- III වැනි ශ්‍රේණියේ විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් ප්‍රශ්න පත්‍ර ඇතුලත් වේ. :-
(i) සාමාන්‍ය දැනීම පැය 01ක ප්‍රශ්න පත්‍රයක් :
(ii) පුස්තකාල විද්‍යාව පිළිබඳ පැය 02ක ප්‍රශ්න පත්‍රයක්

2. අපේක්ෂකයන්ගේ වයස අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අය සඳහාවයස්සීමාව බලපවත්වනු නොලැබේ.

(ආ) සීමිත තරග විභාගය -

(i) ඉහත 1 හි(අ) හා (ආ) යටතේ ඇති අධ්‍යාපන සුදුසුකම් සපුරාලන හා රජයේ පුස්තකාල සහායක/සේවක තනතුරේ ස්ථිර කරන ලද වසර 10ක සතුටුදයක සේවා කාලයක් ඇති සේවකයෝ III වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරු සඳහා වන සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති. මේ සඳහා වයස සීමාවක් බල නොපැවැත්වේ.
(ii) සීමිත තරග විභාගය සඳහා පහත සඳහන් ප්‍රශ්න පත්‍ර ඇතුලත් වේ.-
(i) සාමාන්‍ය දැනීම - පැය 01ක ප්‍රශ්න පත්‍රයක්
(ii) පුස්තකාල විද්‍යාව පිළිබඳ පැය 02ක ප්‍රශ්න පත්‍රයක්

විවෘත තරග විභාගය හා සීමිත තරග විභාගය සඳහා එකම විභාගයක් පවත්වා විභාගයෙන් ලබන කුසලතාව මත පත්වීම් කරනු ලැබේ.

**06.** II වැනි ශ්‍රේණිය - විවෘත තරග විභාගය :- මෙම ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 40%ක් විවෘත තරග විභාගයකින් ද, ඉතිරි **60%** III වැනි ශ්‍රේණියේ දැනට සිටින නිලධාරීන් සඳහා පැවැත්වෙන සීමිත තරග විභාගයකින් ද සුදුසුකම් ලබන අයගෙන් පුරවනු ලැබේ. එම විභාග, විභාග කොමසාරිස් විසින් පැවැත්වෙනු ඇත.

(i) මූලික අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස. (සා.පෙළ) හෝ ඊට සමාන විභාගයක දී -

(අ) සිංහල/දෙමළ භාෂාව : සහ

(ආ) අංක ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුළුව තවත් විෂයයන් 04කට සම්මාන සහිතව විෂයයන් **06**කින් සමත්වීම අවශ්‍ය වේ. මෙයින් විෂයයන් **05**ක් එක්වර සමත්වී තිබිය යුතුය. ඊට අමතරව

(ඇ) ශ්‍රී ලංකාව තුළ පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යා උපාධියෙන්: හෝ:

(ඈ) පුස්තකාල විද්‍යා විෂයයන් ලෙස ගනිමින් ශ්‍රී ලංකාව තුල පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් පවත්වනු ලබන උපාධි පරීක්ෂණයෙන් : හෝ

(ඉ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂණයෙන් : හෝ

(ඊ) "පිළිගත් විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රවේදී උපාධිය සහ ශ්‍රී ලංකා පුස්තකාල මණ්ඩලයේ මධ්‍ය පරීක්ෂණයෙන්" සමත් වී තිබිය යුතුය.

(ii) එම විභාගය සඳහා පහත සඳහන් ප්‍රශ්න පත්‍ර ඇතුලත් වේ.

(අ) පුස්තකාල විද්‍යාව - පැය **03**ක ප්‍රශ්න පත්‍රයක්

(ආ) මව් භාෂාව හැර දෙවන භාෂා පරීක්ෂණය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) -පැය **02**ක ප්‍රශ්න පත්‍රයක්

II වැනි ශ්‍රේණිය - සීමිත තරග විභාගය - (i) සුදුසුකම් :

(අ) ශ්‍රී ලංකා පුස්තකාල සේවා සංගමයේ මධ්‍ය පරීක්ෂණයෙන් සමත්වී තිබීම : හෝ

(ආ) ශ්‍රී ලංකාව තුල පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යා හා ලේඛකත්ව වෘත්තීය දෙවැනි සහතිකය ලබා තිබීම : හෝ

(ඇ) කණිෂ්ඨ විශ්වවිද්‍යාලයකින් ලබාගත් පුස්තකාල විද්‍යා පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් තිබීම : ඊට අමතරව

(ඈ) ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් පිළිගත් පුස්තකාලයක පුස්තකාලයාධිපතිවරයකු ලෙස වසර **05** ක සතුටුදායක සේවා කාලයක් තිබීම

මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් වේ.

(i) එම සීමිත තරග විභාගය සඳහා පහත සඳහන් ප්‍රශ්න පත්‍ර ඇතුළත් වේ:-

(i) පුස්තකාල විද්‍යාව - පැය **03** ක ප්‍රශ්න පත්‍රයක්:

(ii) මව් භාෂාව හැර දෙවන භාෂා පරීක්ෂණය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - පැය **02**ක ප්‍රශ්න පත්‍රයක්

විවෘත හා සීමිත තරග විභාග සඳහා එකම විභාගයක් පවත්වා කුසලතා මත පත්වීම් කරනු ලැබේ.

07. I වැනි ශ්‍රේණිය - සුදුසුකම් :

(අ) පිළිගත් රජයේ පුස්තකාලයක II වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් වසර දහයක පළපුරුද්ද : හෝ
(ආ) ශ්‍රී ලංකාව තුළ පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාවේදී උපාධිය සහ උපාධිය ලැබීමෙන් පසු II වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයකු වශයෙන් වර්ෂ පහක පළපුරුද්ද : හෝ
(ඇ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂණ සහතිකය සහ පිළිගත් පුස්තකාලයක II වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයකු ලෙස වර්ෂ පහක පළපුරුද්ද : හෝ
(ඈ) ශ්‍රී ලංකාව තුළ පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යා හා ප්‍රලේඛණ සේවා වෘත්තීය උසස් සහතික පත්‍රය සහ II වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයකු වශයෙන් වර්ෂ පහක පළපුරුද්ද : හෝ
(ඉ) පිළිගත් විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රවේදී උපාධිය සහ ශ්‍රී ලංකා පුස්තකාල මණ්ඩලයේ මධ්‍ය පරීක්ෂණය සමත්වීම සහ දෙවැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයකු වශයෙන් වර්ෂ පහක පළපුරුද්ද

ඇති නිලධාරීන් සඳහා විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

**08.** අධි ශ්‍රේණිය :- දැනට අධි ශ්‍රේණියේ සිටින නිලධාරීන් පමණක් නව සේවා ව්‍යවස්ථාව යටතේ අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

එසේ කිරීමෙන් අනතුරුව යම්කිසි ඇබෑර්තු සංඛ්‍යාවක් තවදුරටත් පවතින්නේ නම් පසුගිය වසර **05** ක තුළ සතුටුදායක සේවා කාලයක් ඇති I වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් කෙරෙන නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂම විසින් මෙම පත්වීම් කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය, පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ, අයවැය අධ්‍යක්ෂ ජනරාල්/ අයවැය අධ්‍යක්ෂ මට්ටමට නොඅඩු තත්ත්වයේ ඔහුගේ නියෝජිතයෙකු, සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් දෙදෙනකුගෙන් ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්/ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ මට්ටමට නොඅඩු තත්ත්වයේ ඔහුගේ නියෝජිතයකුගෙන් ද සමන්විත විය යුතුය.

**09.** ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - (i) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පහත සඳහන් විෂයයන් ඇතුළත් වේ:-

(අ) සාමාන්‍ය පරිපාලනය
(ආ) මූල්‍ය ක්‍රම

(ii) කාර්යක්ෂමතා කඩඉමට නියමිත විෂයයන් සියල්ලටම එකවර හෝ වෙන් වෙන් වශයෙන් පෙනී සිටීමට අවසර ඇත. සාමාර්ථය සඳහා අපේක්ෂකයකු එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු සියයට **40**ක්වත් ලබා ගත යුතුය. සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම පැය **02**ක කාලයක් ලැබේ.

(අ) සාමාන්‍ය පරිපාලනය - ආයතන සංග්‍රහයේ I සිට VIII දක්වා ද XII,XIV,XXIV,XXVII,XXVIII,XXXI,XXXII,XXXIII පරිච්ඡේද ඇතුළත් වේ.
(ආ) මුදල් රෙගුලාසි - I වන කොටස (X වැනි පරිච්ඡේදය හැර) පුස්තකාල මඟින් ඉටු කරනු ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාළ රෙගුලාසි.

**10.** ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - (i) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පහත සඳහන් විෂයයන් ඇතුලත් වේ:-

(අ) සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම :

(ආ) පුස්තකාල සංවිධාන

(ii) කාර්යක්ෂමතා කඩඉමට නියමිත විෂයයන් සියල්ලටම එකවර හෝ වෙන් වෙන් වශයෙන් පෙනී සිටීමට අවසර ඇත. සාමාර්ථය සඳහා අපේක්ෂකයකු එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු සියයට **40**ක්වත් ලබා ගත යුතුය. සැම ප්‍රශ්න පත්‍රයක් සඳහාම පැය **03**ක කාලයක් ලැබේ.

(අ) සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම :

- (i) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- (ii) ආයතන සංග්‍රහයේ I සිට VIII දක්වා ද, XIV,XXIV,XXV,XXVII, XXVIII,XXXI,XXXII,XXXIII ඇතුලත් වේ.
- (iii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ව්‍යවස්ථාපිත කිරීමේ පනත - 714
- (iv) ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩල පනත
- (v) බුද්ධිමය දේපල පනත
- (vi) මුදල් රෙගුලාසි - I වැනි කොටස
- (vii) පුස්තකාල මගින් ඉටු කරනු ලබන ගිණුම් කටයුතු හා ඒවාට අදාල රෙගුලාසි

(ආ) පුස්තකාල සංවිධානය :

- (i) පුස්තකාල වර්ග හා සේවා
- (ii) පුස්තකාල සම්භාර හා සංවිධාන
- (iii) රජයේ ප්‍රකාශන හා ඒවායේ භාවිතය

11. මෙම ව්‍යවස්ථා සංග්‍රහය ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු රෙගුලාසිවලට ද, රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම නිලධාරීහු බැඳී සිටිති.